# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2188/48 - 2020 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2020.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බෙන්තොට ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද

(267 වන අධිකාරිය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ යෝජනා අංක 5.6.2 (x) යටතේ සම්මත කරන ලද පහත යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ, ආණ්ඩුකාර විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

විලියම් විජේසිංහ ගමගේ,
දකුණු පළාත් ආණ්ඩුකාර.

2020 පෙබරවාරි මස 25 වැනි දින,
ගාල්ල,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

(267 වන අධිකාරිය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෙන්තොට ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක)ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකළ යුතු යැයිද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය. එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස බෙන්තොට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, බෙන්තොට ප්‍රාදේශීය සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

08 - 632


1A - PG 5092 — 22 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*